# ගාලු උරුමය පදනම - 2011
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ජංගම නොවන වත්කම් ක්ෂය කිරීමට අදාල ප්‍රතිශතයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ගාලු උරුමය පදනම පිහිටි පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.279,706 ක අලුත්වැඩියා වියදම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) රූගතකිරීම් සඳහා අවසර දීමෙන් ලැබූ රු.642,700 ක ආදායම හා ඊට අදාල රු. රු.43,000 ක වියදම් වෙන වෙනම ගිණුම්ගත කරනු ලැබිය යුතු වුවත්, එම ආදායමෙන් වියදම් අඩු කිරීමෙන් පසු ශුද්ධ ආදායම රු.599,700 ක් පමණක් අදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානයේ සේවාවන් හා පොත් අලෙවිය මගින් රු.57,081 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ එකී ආදායම හා එම ආදායම් උපයා ගැනීමට අදාල රු.42,403 වියදම ගිණුම්ගත කළයුතු වුවත් එම පොත් හා ප්‍රකාශ තොග ගිණුමෙන් අලෙවිකළ පොත් හා පත්‍රිකා වියදම අඩුකර ලාභය තොරතුරු මධ්‍යස්ථානයේ ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ඉ) පදනමේ ප්‍රධාන කාර්යාලය පවත්වනු ලබන පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ හා ගාලු කොටුවේ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද රු.8,486,785 ක් විලම්භිත අයභාර වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධනිත කර 5% බැගින් වාර්ෂිකව ක්ෂය කර තිබුණි.

1.2.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙන

------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල ලෙජර් ගිණුම්වල එකතුව රු.5,897,387 ක් වූ ජ'නල් සටහන් 259 ක් මගින් ගැලපීම් කර තිබුණි. එම ජ'නල් සටහන් සඳහා ජ'නල් වවුචර් පිළියෙල කර නොතිබූ අතර, විධිමත් අනුමැතියකින් තොරව එම ජ'නල සටහන් ගිණුම් ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය පරිත්‍යාගශීලීන්ගේ ලැබීම්ද ඇතුළුව රු.598,778 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.486,055 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,084,833 ක පිරිහීමක් සඳහා පරිපාලන වියදම්වල රු.1,857,014 ක වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යයසාධනය

-------------------

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වසර සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රගති වාර්තා අනුව පහත සඳහන් ඉලක්කයන් මේ දක්වා ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(i) ප්‍රදීපාගාරය අසල නාන තටාක 02 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
(ii) දේශීය හා විදේශීය සංචාරකයින්ට සංචාරක බෝට්ටු සේවාවක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය
(iii) යෝජිත රථ ගාල් ස්ථාපනය කිරීම හා රථවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
(iv) උල්පත් විමර්ෂණ පුස්තකාල ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීම.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගාලු උරුමය පදනමේ ගාලු කොටුවේ සංරක්ෂණ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තත්කාර්ය පදනම මත බඳවාගන්නා ලද අනියම් කම්කරුවන් දෙදෙනකු යොදවා තිබුණු අතර, ඔවුන් සඳහා 2011 ජූලි මස සිට 2011 ඔක්තෝබර් මස දක්වා රු.93,100 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් කොටුපවුරේ සංරක්ෂණ කටයුතු පිළිබඳ මනා අධීක්ෂණයක් සිදු නොවන බවත් , 2011 නොවැම්බර් 09 දින පරීක්ෂණ අවස්ථාවේදී මෙම කම්කරුවන් දෙදෙනා සේවයට පැමිණි බවට අත්සන් කර තිබූ නමුත් අදාල කොටුපවුර ප්‍රදේශයේ නොසිටි බවත් නිරීක්ෂණය විය.

(ආ) ගාලු උරුමය පදනමේ පාවිච්චිය සඳහා අමාත්‍යාංශය විසින් 2010 මැය 31 දින සිට ලබාදී ඇති අංක 51-8846 දරන කැබ් රථය පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

2010 ජූනි 29 දින රු.28,000 ක මුදලක් වැයකර තණකොල කපන යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණද, එම කාර්යය පෞද්ගලික ආයතනයක් මගින් ඉටුකරන බැවින් එම යන්ත්‍ර නිෂ්ක්‍රීයව තිබූ බව නරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කලයුතු වේ.

(අ) අත්තිකාරම්
(ආ) මුදල් බැංකුගත කිරීම්
(ඇ) ගිණුම්තැබීම
(ඈ) අලුත්වැඩියා
(ඉ) ඉන්වෙන්ට්‍රි නඩත්තු කිරීම